PN/VAT/2020-03
26.03.2020

# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## බදු ගෙවන්නන් වෙත කෙරෙන නිවේදනයයි

## එකතු කළ අගය මත බද්ද (VAT)

2020 මාර්තු 23 වන දිනැතිව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ලබා දුන් උපදෙස් ප්‍රකාරව, පහත සඳහන් කරුණු බදු ගෙවන්නන් වෙත දැනුම් දෙනු ලැබේ.

- 2020 පෙබරවාරි සහ මාර්තු මාස සඳහා එකතු කළ අගය මත බද්ද ගෙවීම

  පෙබරවාරි මාසය සඳහා 2020 මාර්තු මස 20 දින ගෙවිය යුතු වූ සහ මාර්තු මාසය සඳහා 2020 අප්‍රේල් 20 දින ගෙවීමට නියමිත, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඇතුළුව එකතු කළ අගය මත බද්ද ගෙවීම සඳහා 2020 අප්‍රේල් 30 දින දක්වා ඉඩ දෙනු ලැබේ.

  ඒ අනුව, ඉහත සඳහන් කාල සීමා සඳහා 2020 අප්‍රේල් 30 දින හෝ එදිනට පෙර කරනු ලබන ගෙවීම්, නියමිත දිනට කරනු ලබන ගෙවීම් සේ සලකනු ලබන අතර පද්ධතිය මගින් ඉහත සඳහන් කාල සීමා සඳහා ප්‍රමාද ගෙවීම් මත පනවනු ලබන දණ්ඩන ඉවත් කරනු ලැබේ.

මෙයට අමතරව, දැනට රට තුළ පවතින තත්වය සලකා බැලීමෙන් පසු, සියළුම එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් වෙත පහත කරුණු පිළිබඳව දැනුම් දෙනු ලැබේ.

- රේගුවේදී සහ ආයෝජන මණ්ඩලයේදී එකතු කළ අගය මත බද්ද විලම්බනය කිරීම

  එකතු කළ අගය මත බද්ද විලම්බනය කිරීමේ පහසුකම යටතේ විලම්බනය කරන ලද එකතු කළ අගය මත බද්ද ට හිලව් වශයෙන් ඉදිරිපත් කළ යුතු බැර වවුචර් පත් සම්බන්ධයෙන් නිකුත් කරන ලද කාලය දීර්ඝ කිරීමේ ලිපිවල (2020 අප්‍රේල් 30 වන දිනට පෙර අවලංගු වන) වලංගු භාවය, අදාළ ලිපි වල දක්වා ඇති අවලංගු වන දින සිට තවත් මාසයක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබේ.

- තාවකාලික එකතු කළ අගය මත බද්ද

  යම් තාවකාලික එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි සහතිකයක් නිකුත් කර ඇත්නම් සහ එම ලියාපදිංචි සහතිකයේ වලංගුභාවය 2020 අප්‍රේල් 30 වන දිනට පෙර අවසන් වන්නේ නම්, එම සහතිකය සඳහා වලංගු කාල සීමාව 2020 අප්‍රේල් 30 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

- එකතු කළ අගය මත බදු වාර්තා භාර දීම

  එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව පෙබරවාරි මස සඳහා වන එකතු කළ අගය මත බදු වාර්තාව 2020 මාර්තු 31 දින භාර දිය යුතු වේ.එම කාල සීමාව සඳහා වන එකතු කළ අගය මත බදු වාර්තාව දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ඊ-සේවාව හරහා නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා පහසුකම් සලසා ඇත.

  කෙසේ වෙතත්, එකතු කළ අගය මත බදු වාර්තාව ඊ-සේවාව හරහා හෝ ගෙනැවිත් භාර දීමට නොහැකි තැනැත්තන් සඳහා අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමට 2020 අප්‍රේල් 30 දින දක්වා ඉඩ දෙනු ලැබේ.

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

බදු - වඩා හොඳ අනාගතයකට